## ශ්‍රී ලංකාවේ වසංගත වැලැක්වීම, ඒ සඳහා සූදානම් වීම හා ප්‍රතිචාර දැක්වීම (PPPR) පිළිබඳ ප්‍රජා ප්‍රකාශනය.

සිවිල් සමාජය ලෙස, ශ්‍රී ලංකාව තුළ සාධාරණ හා ඵලදායි වසංගත වැළැක්වීම, ඒ සඳහා සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම උදෙසා අපගේ කැපවීම ප්‍රකාශ කර සිටිමු. මෙම ප්‍රකාශනය මගින් සෑම අයෙකුගේම සමානාත්මතාවය ආරක්ෂා කරමින්, සුරක්ෂිත හා සාධාරණත්වය උදෙසා පුළුල් වූ දැක්මක් ඉදිරිපත් කරයි.

ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයක් ලෙස, විශ්වීය සෞඛ්‍ය ආවරණය (UCH) , PPPR සහ දැනට ගෝලීය වශයෙන් පවත්නා HIV,TB වැනි වසංගත වලට මුහුණ දීම උදෙසා වන ජාත්‍යන්තර ප්‍රකාශයන් සඳහා බැඳී සිටි. මෙම ප්‍රකාශනයේ ඇතුලත් වන මූලධර්ම අනෙකුත් ගෝලීය ප්‍රකාශනයන් ගේ සඳහන් මූලධර්ම හා සමාන වේ. PPPR සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රකාශනයෙහි සඳහන් වන සාධාරණත්වය, යුක්තිය සහ විශේෂයෙන් අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් උදෙසා ගුණාත්මක සෞඛ්‍ය සේවාවන් ලබාදීම අපි පිළිගන්නෙමු. එහි දැක්වෙන සෞඛ්‍ය, සමාජභාවී සමානාත්මතාවය සහ අයිතිවාසිකම් උදෙසා වන නායකත්වය සහ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සේවාවන් උදෙසා කාන්තා සහභාගිත්වය ඇති කිරීම සඳහා අපි සහය දක්වමු. ගෝලීය වසංගත උදෙසා මුහුණ දීමේදී PPPR හි පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය අපි අගය කරමු. මූල්‍ය දුෂ්කරතාවකින් තොරව අත්‍යාවශ්‍ය සහ ගුණාත්මක සෞඛ්‍ය සේවා උදෙසා සාධාරණ ප්‍රවේශයක් පිළිබඳව UCH ප්‍රකාශනයේ දැක්ම සමග අපි එකඟ වෙමු. UCH ප්‍රකාශනයෙහි දැක්වෙන සෞඛ්‍ය පද්ධති ගොඩනැගීම, සෞඛ්‍ය අසමානතා අවම කිරීම, මානව හිමිකම්, සමාජභාවී සමානාත්මතාවය සහ සම- සාධාරණත්වය, සමාජ සාධාරණත්වය සහ ආරක්ෂාව යන කරුණු තවදුරටත් තහවුරු කිරීමට අපි බැඳී සිටිමු. මෙම මහජන ප්‍රකාශනය හරහා ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව සෞඛ්‍ය සම්පන්න අනාගතයක් උදෙසා අපි පෙළගැසෙමු. සෞඛ්‍යසම්පන්න අනාගතයක් උදෙසා නොපසුබස්නා උත්සාහයෙන් අපි එක්ව කටයුතු කරමු.

### මානව හිමිකම් හා සමානාත්මතාවය :

වාර්ගිකත්වය, උපන් ස්ථානය, ආදායම, ලිංගිකත්වය, ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය හෝ ඔවුන්ගේ අබාධිත තත්වයන් නොසලකා සියලු පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිගැනීමටත්, ඒවා ආරක්ෂා කිරීමටත් ප්‍රජාව වශයෙන් අපි බැඳී සිටිමු. සෑම පුද්ගලයකුගේම ආරක්ෂාව සහ අභිමානය පිළිබඳ අවධානය යොමු කරමු. නව යොවුන් වියේ පසුවන්නන්, තරුණයින්, වැඩිහිටි පුද්ගලයන්, කාන්තාවන් හා ගැහැණු ළමයින්, එච් අයි වී සහ ක්ෂය රෝගය සමග ජීවත්වෙන ප්‍රජාව හා අවදානමට ලක්විය හැකි ප්‍රජාව, ආබාධිත ප්‍රජාව සහ අනෙකුත් ආන්තික ප්‍රජාව ආදී ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අපි බැඳී සිටිමු. **සියලුම PPPR හි මැදිහත් වීම් වලදී ප්‍රජාවේ සෑම පුද්ගලයකුගේම මානව හිමිකම් ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට අපි බැඳී සිටිමු.**

### සමාජභාවී සමානාත්මතාවය :

දරිද්‍රතාවයට මුහුණ දෙන කාන්තාවන්ට හා විවිධ සමාජභාවී අනන්‍යතාවන්ට අයත් පුද්ගලයන්ට වසංගත තත්වයන්වලදී සිදුවන අසමානතා අවම කිරීමට කඩිනම් පියවරයන් අපි ඉල්ලා සිටිමු. ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් (SRHR) ප්‍රවර්ධනය හා සියලුම PPPR හි මැදිහත්වීම් වලට අදාලව සමාජයේ සෑම ක්ෂේත්‍රයකම කාන්තා නියෝජනය හා අයිතිවාසිකම් ඉහළ නැංවීමට අපි ඉල්ලා සිටිමු. වසංගත හා හදිසි සෞඛ්‍ය තත්වයන් හිදී සමාජභාවය මත ඇතිවන කොන්කොට සැලකීම හා වෙනස් වෙනස් කොට සැලකීමට එරෙහිව සටන් කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය හා එම ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම උදෙසා අපි පෙනී සිටිමු. **සියලුම දෙනා ඇතුළත් කරගැනීම, වෙනස් කොට සැලකීමෙන් තොර වීම, සමාජභාවී අනන්‍යතාවය සහ මානව හිමිකම් යන මූලධර්ම ආරක්ෂා වන ආකාරයට විවිධ ප්‍රජාවන්ට සෘණාත්මක බලපෑම් ඇතිකරන නීති සහ ප්‍රතිපත්ති වෙනස් කිරීම්මට ඉල්ලා සිටිමු.**

### ප්‍රජා සහභාගිත්වය:

වසංගත සඳහා ඵලදායි ප්‍රතිචාර දැක්වීමක් තුළ ප්‍රජා සහභාගිත්වයේ වැදගත්කම අපි දනිමු. ප්‍රජාවට ක්‍රියාකාරීව සහභාගී වීමට හැකිවන පරිදි ප්‍රජාව සවිබල ගැන්වීමේ මූලපිරීම් වලට අපි සහය දක්වමු. වසංගත සඳහා ප්‍රතිචාර දැක්වීමේදී වගවීම හා විනිවිදභාවය පවත්වාගැනීමට ප්‍රජාව විසින් මෙහෙයවන අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම අපි යෝජනා කරමු. අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ නිශ්චිත අවශ්‍යතා හඳුනාගැනීම සඳහා ඉලක්කගත පර්යේෂණයන්හි වැදගත්කම අපි අවධාරණය කරමු. වසංගත වලට ඵලදායී ප්‍රතිචාර දැක්වීමක් සඳහා අවශ්‍ය දැනුවත් කිරීම්, ප්‍රජා පාදක සංවිධාන (CBOs) සහ සිවිල් සමාජ සංවිධාන (CSOs) වල ධාරිතාව ය හඳුනා ගැනීම සහ ධාරිතාවය වර්ධනය කිරීම අප යෝජනා කරමු. බාධාවකින් තොරව වසගත හා හදිසි අවස්ථාවන් වල සේවා සැපයීම සඳහා CBOs, CSOs සහ රජයේ ආයතන අතර සහයෝගීතාවය ඇති කල හැකි ප්‍රතිපත්ති සැකසීමේ අවශ්‍යතාවය අපි අවධාරණය කරමු. **ආන්තික ජනගහනයන් අර්ථවත් ලෙස සම්බන්ධ කරගැනීමට දායක වන විවිධ ප්‍රජා සම්බන්ධීකරණ සැලසුම් නිර්මාණය කරන ලෙස අපි ඉල්ලා සිටිමු.**

### සම්පත් හා මූල්‍ය ආයෝජන :

වසංගත හා හදිසි සෞඛ්‍ය අවස්ථා උදෙසා ප්‍රතිචාර දැක්වීමට ප්‍රමාණවත් සම්පත් වල අවශ්‍යතාවය අපි හඳුනා ගෙන සිටිමු. PPPR හි ප්‍රයත්නයන් උදෙසා අතිරේක සම්පත් ඇතිකිරීම උදෙසා රාජ්‍ය හා පුද්ගලික අංශයන්හි හවුල්කාරීත්වය අපි ඉල්ලා සිටිමු. වසංගත සඳහා

ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියේදී විනිවිදභාවයකින් යුත් විගනන, සම්පත් කළමනාකරණය හා අරමුදල් වෙන් කිරීමෙහි ඇති වටිනාකම අපි අවධාරණය කරමු. PPPR හි ක්‍රියාකාරකම් ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම උදෙසා පවතින සම්පත් කළමනාකරණය, සිතියම් ගත කිරීම උදෙසා අපි පෙනී සිටිමු. රජයේ ආයතනවල විනිවිදභාවය හා වගවීමේ ප්‍රතිපත්ති වැඩිකිරීමටත් රාජ්‍ය පාර්ශවයන්ගේ වත්කම් හා සම්පත් ප්‍රකාශ කිරීමටත් අපි ඉල්ලා සිටිමු. **කඩිනම් හා ඵලදායි ප්‍රතිචාරයක් සහතික කිරීම සඳහා ජාතික අයවැය සහ සම්පත් වෙන් කිරීමේ උපාය මාර්ග හඳුනා ගන්නා ලෙස අපි ඉල්ලා සිටිමු.**

## තොරතුරු හා සන්නිවේදනය :

වසංගත සඳහා ප්‍රතිචාර දැක්වීමේ ප්‍රයත්නයන් වලදී සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා පර්යේෂණ සහ දත්ත රැස්කිරීමේ වැදගත්කම අපි අවධාරණය කරමු. අදාළ තොරතුරු කඩිනමින් මහජනතාවට ලබා දීමට හැකියාව ඇති, විනිවිදභාවයකින් යුත් සන්නිවේදන ක්‍රම ඉල්ලා සිටිමු. විවිධ ප්‍රේක්ෂකයින් වෙත ඵලදායී ලෙස ළඟා වීමට විවිධ සන්නිවේදන ප්‍රවේශයන් වර්ධනය අපි නිර්දේශ කරමු. අත්‍යාවශ්‍ය තොරතුරු නිවැරදිව බෙදා හැරීම සඳහා සන්නිවේදකයන් තුළ විශ්වාසය ඇති කරන ලෙසත්, වගකීම් සහගත වාර්තාකරණයේ පරිචයක් ඇති කරන ලෙසත් අපි ඉල්ලා සිටිමු. **වසංගත වලදී අත්‍යවශ්‍ය තොරතුරු බෙදා හැරීම, සාක්ෂි නිර්මාණය කිරීමට ප්‍රමුඛත්වය දීම සහ CSO සන්නිවේදන ප්‍රයත්නයන් සඳහා සහාය වීම සඳහා විධිමත් ක්‍රියාවලියක් ස්ථාපිත කරන ලෙස අපි ඉල්ලා සිටිමු.**

ප්‍රජාවන් සහ සිවිල් සමාජය වශයෙන්, වසංගත සහ හදිසි සෞඛ්‍ය අවස්ථා උදෙසා ප්‍රතිචාර දැක්වීමේදි සාධාරණත්වය, සමානාත්මතාවය, වෙනස්කොට සැලකීම නොකිරීම සහතික කිරීම සඳහා රජය, පෞද්ගලික අංශය සහ අනෙකුත් සියලුම පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අපි කැපවී සිටිමු. කිසිවකු අත් නොහරින සුරක්ෂිත හා සාධාරණ ලෝකයක් සඳහා අපි කැපවී සිටිමු. සෞඛ්‍ය සම්පන්න සහ වඩාත් සාධාරණ ලෝකයක් කරා යමින් සෑම පුද්ගලයෙකුගේම යහපැවැත්ම ආරක්ෂා කර ඇති අනාගතයක් සඳහා අපට එක්ව උත්සාහ කළ හැකිය.

---

**මෙම ප්‍රකාශනය APCASO ආයතනයෙහි සහාය ඇතිව DAST ආයතනය විසින් මෙහෙයවා නිර්මාණය කරන ලදී.**